## පළමුවන කියැවීම

සිරාක් 35:12-14, 16-19

උපදේශකයා හෙවත් සිරාක්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

**"බැහැපත් මිනිසාගේ යැදුම් වලාකුළු සිදුරු කරගෙන යන්නේ ය."**

සමිඳාණන් සාධාරණ විනිශ්චයකාරයෙකු වන හෙයිනි. මනුෂ්‍යයන්ගේ තරාතිරම නොබලන සේක. දුප්පතාට හානි සිදු වන ආකාරයෙන් උන් වහන්සේ මිනිසුන් නොසලකන සේක. උන් වහන්සේ පීඩිතයාගේ කටහඬට ඇහුම්කන් දෙන සේක. උන් වහන්සේ අනාථයාගේ අවසාන ඉල්ලීම ඉවත නොලන සේක. තම මැසිවිල්ල වගුරුවන වැන්දඹුවගේ ඉල්ලීම ප්‍රතික්ෂේප නොකරන සේක.

තම මුළු සිතින් දෙවියන් වහන්සේට වැඳුම්පිදුම් කරන්නා පිළිගනු ලබන්නේ ය. ඔහුගේ අයැදුම වලාකුළු දක්වා ඉහළ නගින්නේ ය. බැහැපත් මිනිසාගේ යැදුම් වලාකුළු සිදුරු කරගෙන යන්නේ ය. එය සමිඳුන් වෙත යන තෙක් ඔහු නොනැසෙන්නේ ය. මහෝත්තමයාණන් වහන්සේ ඔහු දෙස නෙත යොමු කරන තෙක්, ධර්මිෂ්ඨයාගේ අයිතිය දී යුක්තිය නැවත පිහිටුවන තෙක්, ඔහුගේ යාච්ඤාව නොනවතින්නේ ය. සමිඳාණෝ ප්‍රමාද නොවන සේක. අධර්මිෂ්ඨයන් උදෙසා ඉවසිලිමත් නොවන සේක.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 34:1-2, 16-18, 22

පිළිතුර: සමිඳාණෝ අසරණයන්ට සවන් දෙන සේක.

ගීය: හැම වේලේ ම හිමි තුමන්ට මම ප්‍රශස්ති ගී ගයමි. එතුමන්ගේ ගුණ වැණුම් මා මුවින් තොර නොවෙයි. මම එතුමන්ගේ ගුණ වර්ණනා කරමි. නිහතමානී අය ඒ අසා තොස් වෙත්වා.

පව්කම් කරන අය පොළොවෙන් අමතක වී යන ලෙස හිමි තුමාණෝ ඔවුන්ට විරෝධය දක්වන සේක. දැහැමි අය අයැදුම් කළහ; හිමි තුමාණෝ සවන් දී සියලු දුක් වේදනාවලින් ඔවුන් මිදූ සේක.

හිමි තුමාණෝ බිඳුණු සිත් ඇත්තන්ට ළං ව සිටින සේක; තැළුණු හදවත් ඇත්තන්ට පිහිට වන සේක. හිමි තුමාණෝ සිය මෙහෙකරුවන් මුදන සේක. එතුමන් කෙරේ විශ්වාසය තබන කිසිවෙක් දඬුවම් නොලබන්නෝ ය.

## දෙවන කියැවීම

2 තිමෝති 4:6-8, 16-18

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් තිමෝතියස් තුමාට ලියන ලද දෙවන හසුනෙන් ගත් කොටසකි.

**"දැහැමි ජීවිතයක කිරීටය මට දැන් වෙන් කර තිබේ."**

මා ගැන කියතොත්, මගේ ජීවිතය දැනට ම පානීය පූජාවක් මෙන් පිදීමට සූදානම් ව ඇත. මාගේ වියෝ වීමේ කාලය දැන් පැමිණ තිබේ. මම යහපත් සටනෙහි සටන් කෙළෙමි. මම දිවීම අවසන් කෙළෙමි, මම ඇදහිල්ල රක්ෂා කෙළෙමි. දැහැමි ජීවිතයක කිරීටය මට දැන් වෙන් කර තිබේ. ඒ මහා දවසේ දී සාධාරණ විනිශ්චයකාර සමිඳාණන් වහන්සේ එය මට දෙන සේක. මට පමණක් නොව, උන් වහන්සේගේ ප්‍රකාශ වීම ආශාවෙන් බලාපොරොත්තු වන සියල්ලන්ට ද එය දෙන සේක. මගේ පළමු නඩු විභාගයේ දී කිසිවෙක් මා සමඟ නොසිටියහ. සියල්ලෝම මා අත්හැර ගියෝ ය. ඒ ගැන ඔවුන්ට වරදක් නොපැමිණේවා. එහෙත් ස්වාමින් වහන්සේ මා අත්හැර නොගොස් මා ශක්තිමත් කළ සේක. මෙසේ මා මඟින් සුබ

අස්න සම්පූර්ණ ලෙස සියලු විජාතීන්ට ඇසෙන සේ ප්‍රකාශ වනු ඇත. එසේ සිංහයාගේ කටින් මම මුදා ගනු ලැබුවෙමි. ස්වාමින් වහන්සේ සියලු දරුණු උවදුරුවලින් මා මුදා, උන් වහන්සේගේ ස්වර්ග රාජ්‍යයට මා පමුණුවන සේක. උන් වහන්සේට සදහට ම මහිමය වේ වා! ආමෙන්."

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**සාධුකාරය** මතෙව් 11:25

ආලේලූයා! ආලේලූයා!
ස්වර්ගයටත්, පොළොවටත් පරමෝත්තම වන පියාණන් වහන්ස,
දේව රාජ්‍යය පිළිබඳ අභිරහස් හුදෙක් බාලයන්ට අනාවරණය කළ හෙයින්
ඔබ වහන්සේට තුති වේවා!
ආලේලූයා!

**ශුද්ධවූ සුවිශේෂය** ලූක් 18:9-14

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"දේව සබඳතා ඇති කර ගත්තේ අයකැමියා ය."**

තමා සිල්වත් යයි සිතමින්, අන් හැම දෙන හෙළා දුටු ඇතැම් අයට ජේසුස් වහන්සේ මේ උපමාව ද වදාළ සේක. "මිනිසුන් දෙදෙනෙක් යාච්ඤාව පිණිස දේව මාලිගාවට නැඟී ගියහ; එක් කෙනෙක් පරිසිවරයෙකි; අනික් තැනැත්තා අයකැමියෙකි. පරිසිවරයා නැඟී සිට පසෙකට වී තනියම යාච්ඤා කරමින්, 'දෙවියන් වහන්ස, මා අන් මිනිසුන් මෙන් වස්තු ලෝභී, වංචනික, කාමමිථ්‍යාචාරී තැනැත්තකු නොවන බැවින් ඔබට තුති පුදමි. මම මේ අයකැමියා වැන්නෙක් ද නොවෙමි. සතියකට දෙවරක් උපවාස කරමි; මා උපයන සියල්ලෙන් දහයෙන් කොටස දෙමි'යි කී ය. එහෙත් අයකැමියා ඈතින් සිට ස්වර්ගය දෙස ඇස් ඔසවා බලන්නට වත් නොසිතා, තමාගේ ළයට ගසාගනිමින්, 'දෙවියන් වහන්ස, පව්කාර වූ මා හට කරුණා කළ මැනවැ'යි කී ය. මෙය මම ඔබට කියමි; දර්මිෂ්ඨ යයි ගණන් ගනු ලැබ ගෙදර ගියේ පරිසිවරයා නොව, මේ අයකැමියා ය. තමා ම උසස් කරගන්නා හැම දෙන ම පහත් කරනු ලබති; තමා ම පහත් කරගන්නා උසස් කරනු ලබන්නේ ය."

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.com/ වෙත පිවිසෙන්න.